(5)

# අභ්‍යන්තර සටහන

## පළාත් මහ රෝහල - බදුල්ල

| | |
|---|---|
| දිනය | 2022-08- 30 |
| වෙත | සියළුම කාර්ය මණ්ඩලය වෙත |
| වෙතින් | අධ්‍යක්ෂ |
| පිටපත් | කාර්ය මණ්ඩල අංශ ප්‍රධානීන්/අදාළ පෞද්ගලික විෂය භාර නිලධාරින් |
| විෂයය | විදේශ රැකියා සඳහා වැටුප් රහිත නිවාඩු අයදුම්පත් ඉදිරිපත් කිරීම |
| ගොනු අංකය | BD/PGH/CPMA/1/2013 |

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2022 අනුව හා ආයතන සංග්‍රහයේ Xii වන පරිච්ඡේදයේ 16 වැනි වගන්තිය යටතේ විදේශ රැකියා සඳහා නිවාඩු අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී රෝගී සත්කාර සේවාවන්ට බාධාවක් නොවන පරිදි හා රෝගී සත්කාර සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යාමට හැකිවන ලෙස විදේශ නිවාඩු අයදුම්කරු විදේශ ගතව සිටින කාලය තුළ එම නිලධාරියාගේ රාජකාරි වැඩ ආවරණය සඳහා සුදුසු වැඩපිළිවෙලක් සකස් කළ යුතු බැවින්, විදේශගතවීමට අපේක්ෂා කරන දිනට මාස 03 කටවත් කලින් විධිමත් විදේශ නිවාඩු අයදුම්පත සුදුසු වැඩ ආවරණය නිලධාරියෙකුගේ එකඟතාවය සහිතව යොමු කළ යුතු බව මෙයින් දැනුම් දෙමි. මෙම ආයතනය තුළින් වැඩ ආවරණය කළ නොහැකි අවස්ථාවන්වලදී වෙනත් ආයතනයක සුදුසු වැඩ ආවරණ නිලධාරියෙකු පත් කිරීමේදී අදාළ ආයතන භාර ප්‍රධානියාගේ එකඟතාවයද අනිවාර්යයෙන් ලබා ගත යුතුය.

වැඩ ආවරණය සඳහා එකඟතාවය දක්වන නිලධාරියා විදේශ නිවාඩු අයදුම්කරන නිලධාරියා නැවත සේවයට වාර්තා කරනතුරු එම වැඩ ආවරණය සිදු කිරීමට කටයුතු කළ යුතුවේ.අයදුම්කරු විදේශ ගතව සිටින අවස්ථාවකදී එසේ අයදුම්කරු වෙනුවෙන් වැඩ ආවරණය කිරීමට යම් අපහසුතාවයක් පැන නැගෙන්නේනම්, වෙනත් සුදුසු වැඩ ආවරණ නිලධාරියෙකුගේ එකඟතාවය ලබා ගැනීම මුලින් වැඩ ආවරණ කරන ලද නිලධාරියාගේ වගකීමක් වේ.විදේශ නිවාඩු අයදුම් කිරීමේදී තම සේවා අංශයේ රාජකාරි අඛණ්ඩව පවත්වාගෙන යාමට සුදුසු අභ්‍යන්තරික සැළසුම් සකස් කර මාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු බවත්, එසේ වැඩ ආවරණය කිරීමේදී අමතර දීමනා ලබා නොදී රාජකාරි ආවරණය සඳහා සුදුසු වැඩපිළිවෙලක් අදාළ අංශ භාර ප්‍රධානීන් විසින් සැළසුම් කළ යුතු බවත් මෙයින් දැනුම් දෙමි.

මේ සඳහා ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සළකමි.

Dr. Upul Karunarathne
MBBS.MSc (Med.Admin). MD(Med.Admin)
Director
Provincial General Hospital
Badulla.

30/8/22